**අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2018**

**-----------------------------------------------------------------**

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු 2016 දෙසැම්බර් 01 දිනැති අංක සීඑල්කේ - 100901 ආර් දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය අතර 2017 අගෝස්තු 31 වන දින එළඹි සංශෝධිත ණය පහසුකම් ගිවිසුමේ 3.4.4 වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

**-----------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් රැක ගනිමින් අනුරාධපුර නගරයේ පෞරාණික හා නවීකරණය වූ ප්‍රදේශ අතර සමබර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම වේ. ව්‍යපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 9,779.95 කට සමාන යුරෝ මිලියන 62.4 ක් වන අතර ඉන් රු. මිලියන 8,149.96 කට සමාන යුරෝ මිලියන 52 ක් සැපයීමට ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මතය

**------**

වැඩසටහනෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**-------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 770 | භාණ්ඩ සමීක්ෂණයේදී භාවිතා කළ නොහැකි අයිතම හඳුනා ගැනීම හෝ එවැනි අයිතම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හෝ සිදුකර නොතිබුණි. | අවශ්‍ය වාර්තා යාවත්කාලීන නොවීම. | අවුරුදු 02 කට වඩා අඩු කාලයක් සහිත බොහෝමයක් පාරිභෝගික භාණ්ඩ කිසිදු ස්ථාවර වත්කමකට ඇතුලත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව අවශ්‍ය නිර්දේශයන් සිදු කළ යුතුය. |
| (ආ) | අංක 842 හා 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යාපෘතිය මඟින් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් සම්බන්ධ පාලනය දුර්වල වීම. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සොයා බලමින් පවතී. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ණය පහසුකම් සැපයීමේ ගිවිසුමේ 3 උපලේඛණය | ව්‍යාපෘතියේ සම්පූර්ණ කාලය ආවරණය වන පරිදි මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වා සර්ව සම්පූර්ණ ක්‍රියාකාරී සැලැස්මක් සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛණයක් සකස් කර නොතිබුණි. | මූල්‍ය හා භෞතික පාලනය සම්බන්ධ අධීක්ෂණ ක්‍රියාවලිය දුර්වල වීම. | උපදේශන සේවා ලබාදීමේ කටයුතු අවසන් කර නැත. එසේ වුවත් 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇත. | ව්‍යාපෘතියේ කාර්යයන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු සැලසුම් කිරීම හා නිර්වචනය කිරීම කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කාර්යයන්ට අදාල භෞතික කාර්යසාධනය**

| සංරචකය | 2018 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්යසාධනය | | බලපෑම | ප්‍රමාදයට හේතුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අපේක්ෂිත (%) | තථ්‍ය (%) | | | | |
| (අ) තිරසාර නාගරික යටිතල පහසුකම් හඳුනා ගැනීම | 100 | නැත | ව්‍යාපෘතියේ සියලුම කාර්යයන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට සිදු වීම. | ව්‍යාපෘතියේ මූලික සැලසුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය | නොවැළැක්විය හැකි හේතුන් මත ප්‍රධාන රථ වාහන පාලන සැලසුම් සහ වැසි වතුර පාලනය කිරීමේ සැලසුම් ප්‍රමාද වී ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඵලදායි හා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) විස්තරාත්මක සැලසුම් සකස් කිරීම සඳහා වූ උපදේශන සේවා | 100 | 33 | ව්‍යාපෘතියේ සියලුම කාර්යයන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට සිදු වීම. | වාර්තාව 2018 ඔක්තෝබර් 12 දින උපදේශකයන් විසින් ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණද එම වාර්තාව සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | නොවැළැක්විය හැකි හේතුන් මත ප්‍රධාන රථ වාහන පාලන සැලසුම් සහ වැසි වතුර පාලනය කිරීමේ සැලසුම් ප්‍රමාද වී ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඵලදායි හා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 ඌන උපයෝජිත සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර වර්ෂ 2 ක් ගත වී තිබුණද ණය ලබාදීමේ නියෝජිතායතනය මඟින් ප්‍රතිපාදනය කර තිබුණු රු.මිලියන 8,149.96 කට සමාන වූ යුරෝ මිලියන 52 ක මුදලින් රු.මිලියන 146.58 කට සමාන වූ යුරෝ මිලියන 0.91 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදනය කර තිබුණු රු.මිලියන 345 ක මුදලින් රු.මිලියන 149.41 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණි. | ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට සිදුවීම. | උපදේශකයන් විසින් විස්තරාත්මක නිර්මාණ සැලසුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය අරමුදල් ඌන උපයෝජනය සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. | මූල්‍ය සැලසුම් ඵලදායී ලෙස පිළියෙල කිරීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පදිංචිය සඳහා ව්‍යාපෘතිය මඟින් නිවාසයක් බදු පදනම මත ලබාගෙන ඒ සඳහා රු.100,000 ක අත්තිකාරමක් 2018 නොවැම්බර් මාසයේදී ගෙවා තිබුණි. එසේ වුවත් මෙකී නිවාසය අරමුණුගත කාර්ය සඳහා 2019 මැයි මාසය දක්වාම යොදවාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදනය කළ අරමුදල් වෙනත් අරමුණු සඳහා යෙදවීම. | බදු පදනම මත ලබාගත් නිවාසය අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් භාවිතා නොකිරීම නිසා පසුව වෙනත් නිවාසයක් බදු පදනම මත ලබා ගන්නා ලදී. රු.100,000 තැන්පත් මුදල් නිදහස් කරන ලද කලින් බදුගත් නිවාසයේ හිමිකරුගෙන් ඉල්ලීමක් කර ඇත. | නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| කාර්ය මණ්ඩල විස්තරය | 2018 දෙසැම්බර් 31 දිනට තිබුණු තනතුරු සංඛ්‍යාව | | | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | | | |
| නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ<br>ව්‍යාපෘති විශේෂඥ<br>සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01<br>03<br>11 | නැත<br>නැත<br>04 | 01<br>03<br>07 | ව්‍යාපෘතියේ කාර්යසාධනයට බලපෑම | 2018 දෙසැම්බර් 31 දිනට සංවර්ධන කටයුතු කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඇතැම් තනතුරු 2018 දෙසැම්බර් 31 දක්වාම පුරප්පාඩුව පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩලයට අනුව තනතුරු පිරවීමට කටයුතු කළ යුතුය. |

### 3.4 පද්ධති හා පාලන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය සඳහා රාජකාරි ලැයිස්තු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පිළියෙල කර නොතිබුණි. | නිලධාරීන්ගේ කාර්යසාධන ගැලපීම ක්‍රියාත්මක නොවීම. | ඇතැම් තනතුරුවල රාජකාරි ලැයිස්තු පිළියෙල කිරීමට දැනටමත් සම්පූර්ණ කර ඇත. ඉතිරි වැඩ කටයුතු සිදුකරමින් පවතින අතර එම කටයුතු 2019 ජුනි 30 දින වන විට අවසන් කිරීමට නියමිතය. | නිලධාරීන් සඳහා රාජකාරි ලැයිස්තු ලබාදිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර නොතිබුණි. එසේම, මානව සම්පත් සැලැස්මේ ඇතුළත් කර තිබුණු පරිසර සංරක්ෂණ කළමනාකරු, සංවර්ධන හා සමාජ සම්බන්ධීකාරක, පරිගණක දත්ත ක්‍රියාකරු හා සේවා සහායක යන තනතුරු, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර නොතිබුණි. | බඳවා ගැනීමේ විනිවිදභාවය සඳහා බලපානු ලබයි. | නියමානුකූල කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | බඳවා ගැනීමේ පරිපාටිය නියමිත පරිදි කඩිනමින් සකස් කළ යුතු අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.4 වගන්තිය ප්‍රකාරව ලංසුකරුවන් වෙත ලංසු ලියවිලි නිකුත් කිරීමට අදාලව වෙනම ලේඛනයක් ව්‍යාපෘතිය විසින් නඩත්තු කර නොතිබුණි. මෙම නිසා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 (ඊ) වගන්තිය ප්‍රකාරය සමාලෝචිත වර්ෂයේ අවස්ථා 2 කදී රු.557,100 කට මිලට ගෙන තිබුණු අයිතමයන්ට අදාලව ටෙන්ඩර් ලියවිලි නිකුත් කිරීමේ විස්තර ලබාගත නොහැකි විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවයක් නොමැති විය. | ලංසු ලියවිලි නිකුත් කිරීමට පෙර කොන්ත්‍රාත්කරුවන්ගේ/ සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවක් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ හැක. |
| (ඈ) | ස්ථාවර වත්කම් මිලටගත් දිනයේ සිට එම වත්කම් කාලය කිරීමට කටයුතු නොකර, වත්කම් මිලටගත් වර්ෂයට පසු වර්ෂයේ සිට ක්ෂය කිරීම සිදුකර තිබුණි. | ගිණුම්කරණ ගැලපුම් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම. | ව්‍යාපෘතිය ආරම්භයේ සිටම මෙම ක්ෂය ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |